# COLONICAL TRANSFORMATION IN SRI LANKA (Part III)

# දේශපාලන ප්‍රතිඵල

පූර්ව යටත් විජිත රාජ්‍යයේ දේශපාලනය සැකසී තිබුණේ රජු හෙවත් භූපති කේන්ද්‍රීයව ය. රජු සාම්ප්‍රදායික නීතියට අනුව පාලනය ගෙන යා යුතු යයි ප්‍රතිමාණයක් පැවතියත්, එම ප්‍රතිමාණ වලංගු වූයේ භූපතිගේ අභිමතයට යටත් ව ය.

එබැවින් පූර්ව යටත් විජිත රාජ්‍යයේ පාලනය අත්තනෝමතික විය. බ්‍රිතාන්‍ය පාලන යුගයේ හඳුන්වා දුන් කෝල්බෲක්-කැමරන් යෝජනා වලින් මේ තත්ත්වය පරිවර්තනයට ලක් වූ අතර, තදනුබද්ධ ප්‍රතිසංස්කරණාවලින් එම වෙනස්වීම් තව තවත් ඉදිරියට ගෙන යන ලදි.

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මඟින් ලංකාවේ පැවති ද්විත්ව පාලනය අහෝසි කොට මුළු රටම එක පොදු නීති ක්‍රමයක් යටතට ගෙනවිත් පළාත් පහකට බෙදා, රටේ පරිපාලන කටයුතු මධ්‍යගත කරන ලදි. මේ ක්‍රියාවලිය වූකලි අනාගතයේ ඒක බල කේන්ද්‍රීය මධ්‍යගත ඒකීය රාජ්‍යයකට අවශ්‍ය වන පදනම දැමීමක් ද විය.

ClassWork.LK

අනෙක් අතට ලංකාව ව්‍යවස්ථානුකූල පාලනයකට යොමු කරමින් යටත් විජිත පරිපාලන ප්‍රතිසංස්කරණ මඟින් ආණ්ඩුකාරවරයාගේ අත්තනෝමතික පාලන බලතල සීමා කොට, පුද්ගලාභිලාෂ සාධනය ළඟාකර ගත හැකි ව්‍යූහයක් නිර්මාණය කිරීමෙහි ලා අවශ්‍ය වන නෛතික හා දේශපාලන අත්තිවාරම ද කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ මඟින් දමනු ලැබිණි. එමඟින් ආණ්ඩුකාරවරයා කිරීටයට වගකිව යුතු ය යන සිද්ධාන්තය ඉස්මතු කිරීමට ද උත්සාහ කෙරිණ.

එමෙන් ම ආණ්ඩුකාරයා තම අභිමතය අනුව ගෙන යන පාලනය වෙනුවට විධායක සභාවේ අනුමතිය ඇති ව අයවැය සකස් කළ යුතු ය යන කොන්දේසිය මඟින් වගකීම් සහගත පාලනයකට නතු කිරීමට ගනු ලැබූ උත්සාහය ඉදිරියේ දී දේශපාලන විධායකයක් ගොඩ නැඟීමෙහිලා මූල බීජය බවට පත් විය.

Class Work LK

ආණ්ඩුකාරයාට නීති සම්පාදනය කිරීමට තිබූ බලය සීමා කරමින් ව්‍යවස්ථාදායක සභාව ඇති කිරීමෙන් අනාගත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකට අවශ්‍ය පදනම දැමිණි. ඉන් පසු ඇතිවූ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණවලට මඟ පෙන්වූයේ මේ පදනමයි.

තවද ලංකාවට ප්‍රථම වරට නියෝජනය පිළිබඳ සිද්ධාන්තය මේ මඟින් හඳුන්වා දෙනු ලැබිණි. නීති සම්පාදනය සම්බන්ධ ව ව්‍යවස්ථාදායක සභාව ඇති වූ අතර, ආණ්ඩුකාරයා සභාවේ වැඩ කටයුතුවලට සම්බන්ධ නොවී ය. මෙයින් බලාපොරොත්තු වූයේ වගකීම් සහිත පාලන ක්‍රමයක් බිහි වීමය.

යටත් විජිත පරිවර්තනයේ තවත් වැදගත් අංගයක් ලෙස ලංකාවේ නීති ක්‍රමය සංශෝධනය කිරීම හා පරිපාලනය මධ්‍යගතකරණය හඳුන්වා දිය හැකි ය. මුළු ලංකාව ම එක ම අපරාධ නීති ක්‍රමයකට ගෙනා අතර ප්‍රාදේශික නීතියක් වූ උඩරට නීතිය පුද්ගල නීතියක් බවට පත් කරන ලදි. ඒ සිවිල් කටයුතු අරභයා ය.

ClassWork.LK

ලංකාව පරිපාලන ඒකක පහකට බෙදා කච්චේරි පරිපාලන ක්‍රමය හඳුන්වා දෙන ලදි. මේ අනුව ලංකාව ඒකීය පරිපාලන ව්‍යුහයකට ගෙන ආවෝ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයෝය. ව්‍යවස්ථානුකූල පාලනය පිළිබඳ ව පදනම වැටීම මඟින් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ බීජය රෝපණය විය.

1910 මැකලම් ආණ්ඩු ක්‍රමයෙන් ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වාදීම් හේතුවෙන් උගත්කම හා දේපළ හිමිකම අනුව සීමිත කණ්ඩායමකට ඡන්ද බලය ලැබිණි.

මෙය 1920 වන විට තව දුරටත් වර්ධනය කරමින් පළාත්බද නියෝජනයට මඟ පාදා දෙනු ලැබිණි.

1924 ප්‍රතිසංස්කරණ මඟින් සීමිත සහ පළාත්බද ඡන්ද බලය තව දුරටත් පුළුල් කරන ලදි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට ගෙන යාමට මෙය හේතු විය.

ClassWork.LK

1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මඟින් වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදීමේ පදනම වැටිණ. ඒ අනුව අවුරුදු 21 ට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට ම සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කෙරිණ.

පැවති ව්‍යවස්ථා දායක සභාව අහෝසි කරමින් නව ව්‍යවස්ථාදායකයක් ඇති කරන ලදි. රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින් වූ, එය නියෝජිතයන් 61 දෙනෙකුගෙන් සමන්විත විය.

ClassWork.LK

පැවති වාර්ගික නියෝජනය අහෝසි කරමින් පළාත්බද නියෝජනය ඇති කරන ලදි. මේ යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට සර්වජන ඡන්ද බලය මඟින් නියෝජිතයෝ 50 දෙනෙක් ද ආණ්ඩු කාරයාගේ නාමකරණයෙන් නියෝජිතයෝ 8 දෙනෙක්ද රාජ්‍ය නිලධාරීහු 3 දෙනෙක්ද පත් කරන ලදහ. මේ අය අතරින් කථානායක වරයකු ද පත් කර ගැනීමට අවකාශය ලබාදිණි.

ස්වදේශිකයන් ඉල්ලා සිටි කැබිනට් ක්‍රමය වෙනුවට විධායක කාරක සභා ක්‍රමය ඇති කරන ලදි. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජිතයන් 61 අතුරින් රාජ්‍ය නිලධාරීන් සහ කථානායකවරයා හැර ඉතිරි නියෝජිතයෝ 57 දෙනා විධායක කාරක සභා හතකට බෙදන ලදහ. කාරකසභා හතේ සභාපතිවරුන් හත්දෙනා සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනාගේ එකතුවෙන් අමාත්‍ය මණ්ඩලය සකස් විණි.

1931 ප්‍රතිසංස්කරණය මඟින් ඇති වූ සර්වජන ඡන්ද බලය නිසා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරු පුරුදු විය. මේ නිසා මැතිවරණය මඟින් තම පාලකයන් තෝරා ගැනීමට හා වෙනස් කිරීමට ලාංකික ජනතාව හුරු පුරුදු වූහ.

ClassWork.LK

දේශපාලන බලය හසුරුවන අය ජනතාවට වගකීමට හුරු පුරුදු වූයේ සර්වජන ඡන්ද බලය හේතු කොටගෙන ය. දේශපාලනඥයන් ජනතාවට වගකීමට නැඹුරු වූයේ ජනතාවට තමන් දෙන පොරොන්දු වගකීමකින් ඉටු නොකළහොත් ජනතා සහය තමන්ට නොලැබේ ය යන අදහසිනි. ඒ අනුව ඔවුහු වගකීමේ ආණ්ඩුක්‍රමයකට හුරු පුරුදු විය.

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවීමට දේශපාලන පක්ෂ අවශ්‍ය නොවී ය. එමෙන් ම එම ආණ්ඩුක්‍රමය විසින් දේශපාලන පක්ෂ බිහි වීම අධෛර්යවත් කරන ලදී. එහෙත් සර්වජන ඡන්ද බලය හේතු කොටගෙන ඡන්ද දායකයන් සංවිධානය කිරීමට ඇති වන අවශ්‍යතාව නිසා දේශපාලන පක්ෂ ආරම්භ විය.

මේ ආණ්ඩු ක්‍රමවලින් දේශපාලන වශයෙන් ජනතාව සවිබල ගැන්වුණාහ.

ඩොනමෝර් ක්‍රමය මඟින් සමාජ සජීවකරණය වේගවත් විය. සමාජයේ පීඩිත ජන කොටස් සර්වජන ඡන්ද බලය මඟින් අත්කරගත් ශක්තිය යටතේ හිස එසවීමට පටන් ගත්හ.

ClassWork.LK

දේශපාලනඥයන්ගේ පැවැත්ම ජනතාව මත රඳා පවතින දෙයක් බවට පත් වූ නිසා ජනතා සහය වැඩි වැඩියෙන් ලබා ගැනීම සඳහා දේශපාලනඥයන් එකිනෙකා පරයමින් තරගකාරී ලෙස ශුභසාධන වැඩ කටයුතු කිරීමට පටන් ගැනීම ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ දැකිය හැකි ය.

මෙම ආණ්ඩුක්‍රමය යටතේ වගකීම් මෙහෙයවීමට අමාත්‍ය මණ්ඩලය පිහිටුවීම ද වැදගත්ය. ඒ අනුව ආණ්ඩුකාරයා, ඉදිරි කාලයේ දී නාමික විධායක බවට පත් විය. මෙම මණ්ඩලයට තම නිල මෙන් ම පෞද්ගලික මත ද ප්‍රකාශ කිරීමේ අයිතිය තිබිණි. මෙම අමාත්‍ය මණ්ඩලය ඩොනමෝර් මුල් යුගයේදී ක්‍රියා කළේ  කණ්ඩායම් දෙකක් වශයෙනි.

මෙහි දී රාජ්‍ය නලි ධාරීන් වූ රාජ්‍ය ලේකම්, නීති ලේකම් සහ මුදල් ලේකම් වෙත විශාල බලතල ප්‍රමාණයක් හිමි වූ අතර ස්වදේශීය අමාත්‍යවරුන්ට හිමි වූ බලතල පවා පාලනය කිරීමේ  හැකියාව තිබිණි. ආරම්භයේ දී මෙම මණ්ඩලය සාමූහික වගකීමකින් ක්‍රියා නොකළ ද ඩොනමෝර් යුගය අවසානයේ දී එක්සත් කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක විය.

ClassWork.LK

විධායක කාරක සභා ක්‍රමය මඟින් සුළු ජනකොටස්වලටද පාලන කාර්යයට සහභාගී වීමට ඉඩ ප්‍රස්තාව සැලසිණි. අනෙක් අතට පාලන කාර්යයන්හි දී පෞද්ගලික මන්ත්‍රීවරයාට සැලකිය යුතු ස්ථානයක් හිමි විය.

පොදුවේ සියලු ම මන්ත්‍රීවරුන්ට ව්‍යවස්ථාදායක කටයුතු මෙන් ම විධායක කටයුතු ද විෂයයෙහි පුහුණුවක් සහ අත්දැකීම් ලැබිණි.

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ කාලයේ ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පරිවර්තනයේ තවත් වැදගත් අංගයක් වූයේ සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය ව්‍යාප්ත වීම යි.

වමේ ව්‍යාපාරය, ජාතික ව්‍යාපාර, වෘත්තීය සමිති ව්‍යාපාර, ආගමික සංවිධාන, ස්ත්‍රී ව්‍යාපාර යන මේවායේ ව්‍යාප්තිය මෙම කාලයේ සිදුවීම සමාජ පරිවර්තනයට වැදගත් දායකත්වයක් ලබාදිනි.

Class Work LK

මේ අනුව ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සමාජ, ආර්ථික, දේශපාලන ක්ෂේත්‍රයන්හි පරිවර්තනීය සන්ධිස්ථානයක් විය. එය නිදහසින් පසු කාලයේ වේගවත් වූ දේශපාලන පරිවර්තනය සැබෑ ලෙස ආරම්භ වූ අවධිය යි.

ClassWork.LK

ClassWork.LK